# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022/01/20 |

පැමිණිලි පාර්ශවය

01 ජී.ආර්. ජයරත්න බණ්ඩාර මයා.
දර්ශන. පන්නල.
අරනායක.

02 යූ.පී.එස්. පතිරණ මයා
සිසිල්. දෙල්ලබඩ.
කරංගොඩ. රත්නපුර.

03 ඩී. ආරියදාස මයා.
නො 440. තැන්නපිට.
මීදෙණිය. හෙට්ටිමුල්ල.
කෑගල්ල.

වගඋත්තර පාර්ශවය

01 ලේකම්.
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (ස.ප.).
රත්නපුර.

02 ප්‍රධාන ලේකම්.
ප්‍රධාන ලේකම් කාර්යාලය (ස.ප.)
රත්නපුර.

03 ලේකම්.
පළාත් පාලන අමාත්‍යාංශය.
සබරගමුව පළාත් සභාව. නව නගරය.
රත්නපුර.

**<u>පැමිණිලි අංකය : එච්ආර්සී/3859/16</u>**

පැමිණිලිකරුවන් විසින් සිය පැමිණිල්ල මගින් පහත සඳහන් කරුණු මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කර සිටී.

සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වර්ෂ 32 ක් පමණ සේවය කර දැනට විශ්‍රාමිකව සිටින පැමිණිලිකරුවන් පළමුව මධ්‍යම ආණ්ඩුවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා මණ්ඩල නිලධාරී තනතුරට 1981 වර්ෂයේ රාජ්‍ය සේවයට බඳවාගෙන ඇත. අනතුරුව එම පළාත් පාලන දෙපාර්තමේන්තුවේම සේවා අවශ්‍යතාවයන් අනුව අදාල තනතුරු නාමය වෙනස් කර 1984-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක ඊ 3/3/12 හා 1984-01-09 වන දිනැති පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිපිය මගින් පැමිණිලිකරුවන් ප්‍රජා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇත. අදාල බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව 11 ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 1 ශ්‍රේණියට උසස් කිරීම සිදුකළ හැකි බව දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත කිරීමෙන් අනතුරුව පැමිණිලිකරුවන් 1990-06-01 දින සිට සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් ලෙස



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com

සේවයට බඳවාගෙන ඇත. අලුතින් සබරගමුව පළාත් රාජ්‍ය සේවයට ප්‍රජා සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සඳහා සබරගමුව පළාත් රාජ්‍ය සේවයට ආවේණික බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සංශෝධන පත්‍රිකා අංක 02 ආණ්ඩුකාර ලේකම්ගේ අංක 97 අංක 10/2 (47) හා 2006-10-04 දිනැතිව පළාත් සභාව අනුමත කර ඇත. එම සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළාත් රාජ්‍ය සේවයේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු ලෙස වර්ෂ10 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇත්නම් 1 ශ්‍රේණියට උසස් කළහැකි බව දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරුවන්ට 1994 වර්ෂය තුළ 1 ශ්‍රේණියේ පත්වීම් ලැබිය යුතු අතර කිහිප අවස්ථාවකදීම 01 වන වගඋත්තරකරු වෙත ඉල්ලීම් කළද මේ දක්වාම අදාළ උසස්වීම ලබාදී නොමැති බව සඳහන් කර ඇත.

**අපේක්ෂිත සහන**

01 1994 වර්ෂයට පැමිණිලිකරුවන්ට 1 ශ්‍රේණියට උසස්වීම් ලබාදී එම වර්ෂයට පෙරදාතම් කිරීම.

02 ඒ ඒ කාල සීමාවල ක්‍රියාත්මක වූ වැටුප් ප්‍රතිශෝධන වලින් ලැබිය යුතුව තිබූ වරප්‍රසාද ලබාදීම.

03 අදාළ වැටුප් විශ්‍රාම වැටුපට ගැළපීම සහ නියමිත කාලය තුළ උසස්වීම් ලබා නොදීම තුලින් හා ඒ හා සම්බන්ධව පැමිණිලිකරුවන්ට ලබා ගත හැකිව තිබූ රාජ්‍ය සේවයේ උසස් තනතුරු වලට පිවිසීමේ අවස්ථාව අහිමි කිරීමෙන් 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තිය මගින් කියැවෙන මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට නිර්දේශයක් ලබාදීම.

**වගඋත්තරකරුගේ ස්ථාවරය**

අදාළ පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේදී පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර 01 වන වගඋත්තරකරු සිය ස්ථාවරය මෙසේ ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුවන් තිදෙනා 2006-09-01 වන දින සිට ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරේ 1 පන්තියට උසස්වීම් ලබා ඇති අතර ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරේ 11 පන්තියේ වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කළ දිනට එම උසස්වීම පෙරදාතම් කරන ලෙස ඉල්ලා සිටී. 1997-03-05 වන දිනැති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ කාර්යක්ෂමතා කඩඉම සමත් හෝ ඉන් නිදහස් කරන ලද්දා වූ හා රාජ්‍ය/පළාත් පාලන/ පළාත් රාජ්‍ය සේවක වර්ෂ 10 ක සේවා කාලයක් හා ඉන් අවුරුදු 05 ක් 11 වන ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු ලෙස සතුටුදායක සේවා කාලයක් සම්පූණ කර ඇති නිලධාරීන් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව මත 1 පන්තියටඋසස් කරන බව සඳහන් වේ. ඒ අනුව නියමිත සුදුසුකම් සම්පූර්ණ කරන සියලු දෙනාටම 1 පන්තියේ තනතුරු අනුමතව නොමැති බැවින් 1 පන්තියේ තනතුරු අනුව සම්පූර්ණ කර ඇත. පැමිණිලිකරුවන් ප්‍රජා සංවර්ධන නිලධාරී 11 පන්තියේ වසර 10 සම්පූර්ණ වන දිනට තම උසස්වීම පෙරදාතම් කර දෙන ලෙස ඉල්ලා සිටියද ඔවුන් තම සේවා කාලයේ වසර 10 සම්පූර්ණ කරන කාලය වන විට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ප්‍රජා සංවර්ධන නිලධාරී 1 පන්තියේ තනතුරු අනුමතව නොතිබූ බැවින් ද ඔවුන්ට උසස්වීම් ලබාදීම සඳහා භාවිතා කර ඇත්තේ 1:4 අනුපාතය බැවින් ද එසේ වසර 10 න් උසස්වීම් ලබාදෙන්නේ නම් මේ වන විට විශ්‍රාම ගොස් සිටින සෙසු නිලධාරීන්ට ද රාජ්‍ය සේවයේ විවිධ සේවාවන්හි සියලු නිලධාරීන්ට ද එම අවස්ථාව ලබාදිය යුතු බැවින් ද ඒ සම්බන්ධයෙන් බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති බැවින් ද ඉල්ලීම ඉටු කළ නොහැකි බව ප්‍රකාශ කර ඇත.

## නිරීක්ෂණ

උක්ත පැමිණිලිකරු සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ දී පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර, 01 වන වගඋත්තරකරු පරීක්ෂණ වාර කිහිපයකදී කිසිදු හේතු දැක්වීමකින් තොරව ඒ සඳහා සහභාගි වී නොමැති අතර, අනතුරුව සිතාසිය සහ දුරකථනය මගින්ද සිදු කරන ලද දැනුම් දීම් වලින් අනතුරුව පරීක්ෂණය සඳහා සහභාගි වී නැත. 1997-03-15 වන දින අනුමත සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනය වන විටත් පැමිණිලිකරුවන් තිදෙනා සබරගමුව පළාත් රාජ්‍ය සේවය යටතේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරෙහි සේවය කරමින් සිට ඇති අතර බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීමේදී එවකට සේවයේ යෙදී සිටි නිලධාරීන්ට අගතියක් සිදු නොවන ආකාරයට කටයුතු කළ හැකිව තිබියදීත් එසේ සිදු කර නොමැති බව නිරීක්ෂණය වේ.

අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත වන දිනය වන විට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ 1 ශ්‍රේණියට ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරු අනුමතව නොතිබුණු බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන අතර, එසේ නම් 11 ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලයකින් පසු 1 ශ්‍රේණියට උසස් කිරීමේ විධි විධාන බඳවා ගැනීමේ පරිපාටියට ඇතුළත් කිරීම ගැටලුවකි. යම් තනතුරකට උසස්වීම් ලබාදීමේදී පූරප්පාඩු ප්‍රමාණයක් අනුව එම උසස්වීම් ලබා දෙන්නේ නම් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත දිනය වනවිට එම තනතුරු සංඛ්‍යාව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන එම විධිවිධාන බඳවා ගැනීමේ පරිපාටියට ඇතුළත් කළයුතු වුවත් 01 වන වගඋත්තරකරු එවැනි නීත්‍යානුකූල ක්‍රියා මාර්ගයක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වේ.

එසේම බඳවා ගැනීමේ පරීක්ෂණය අනුමත කිරීමෙන් වසර 07 කට පසු එම පරීක්ෂණයේ නියෝගයන් උල්ලංඝණය කරමින් උසස්වීම් ලබාදීම සඳහා අනුපාත ක්‍රමයක් හඳුන්වා දීමෙන් පැමිණිලිකරුවන්ට අසාධාරණයක් සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරන දිනය වන විට 1 ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරු අනුමත කරවාගෙන නොතිබීම හේතුවෙන් උසස්වීම් ලබාදීමට නොහැකි වූ බවට වගඋත්තරකරුගේ ප්‍රකාශය පිළිගත නොහැකි වන අතර එසේ තනතුරු තව නොතිබුනේ නම් බඳවා ගැනීමේ පරීක්ෂණයට 1 ශ්‍රේණියට උසස්වීමේ විධිවිධාන ඇතුළත් කළේ කුමන පදනමකින් ද යන්න විමසිය යුතුය. බඳවා ගැනීමේ පරීක්ෂණය අනුමත කරවා ගන්නා අවස්ථාවේ ලබාදීමට තීරණය කිරීමෙන් පැමිණිලිකරුවන්ට විශාල අගතියක් සිදුවී ඇති අතර පැමිණිලිකරුවන් ප්‍රජා සංවර්ධන නිලධාරී 11 ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලයක් සපුරන දිනය දක්වා මේ වනවිට 1 ශ්‍රේණියට ලබාදී ඇති උසස්වීම් පෙරදාතම් කරන ලෙසට සිදු කරන ඉල්ලීම සාධාරණ බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

එසේම, පැමිණිලිකරුවන් විසින් මේ සම්බන්ධයෙන් සබරගමුව පළාත් ආණ්ඩුකාර ජනාධිපති නීතිඥ මාර්පල් පෙරේරා මහතා වෙත අභියාචනය කරන ලදුව පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම අනුව අදාළ පත්වීම පෙරදාතම් කරන ලෙසට 01 වන වගඋත්තරකරු වෙත කිහිප අවස්ථාවන්හි දී නියෝග කළද එම නියෝග ද පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ.

මේ හා සමාන කාරණා සහිත තත්වයන්හි දී විවිධ පළාත් සභාවන් ගත් තීරණයන්ද උදාහරණ වශයෙන් ඉදිරිපත් කළහැකි අතර දකුණු පළාත් සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ බඳවා ගැනීමේ පරීක්ෂණ අනුමත කර ඇත්තේ 2003-12-14 වන දින වන අතර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 528/(1) හා 2005-04-06 දරණ ලිපිය මත පදනම්ව ප්‍රජා සංවර්ධන නිලධාරීන් වන කේ. රූපසිහ මහතාට සහ බී.ජී. සිරිසේන මහතාට 2006-02-06 වන දින ලබාදී ඇති පත්වීම් ලිපිවල උසස්වීම් ක්‍රියාත්මක වන දිනය ලෙස සඳහන්ව ඇත්තේ 2003-12-14 දිනයයි. එනම් එදිනට පත්වීම් පෙරදාතම් කර ඇත.

එසේම බස්නාහිර පළාත් සභාවේ 2008 වන විට 1 ශ්‍රේණියේ වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට පළාත් පාලන සහකාර කොමසාරිස් (ප්‍රජා සංවර්ධන ) තනතුරු ලබාදී ඇති අතර උදාහරණ ලෙස ටී.ආර්. කාලිංග මහතාට 2008-06-05 වන දිනට පත්වීම් ලබාදී ඇත. ඒ අනුව විවිධ පළාත් වල නිලධාරීන්ට ලබා දුන් අයිතිවාසිකම් සබරගමුව පළාත් සභාවේ පැමිණිලිකරුවන්ට ලබා නොදීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්ති ප්‍රකාරව හඳුන්වා දී ඇති නීතිය ඉදිරියේ සමානාත්මතාවයේ අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුවන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් අපේක්ෂිත සහන ලබාදීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් නීත්‍යානුකූල ලෙස තහවුරු කරන ලද තර්ක ඉදිරිපත් නොකරන ලද අතර පැමිණිලිකරුවන්ට මෙම සහන ලබාදෙන්නේ නම් තවත් නිලධාරීන්ටද සහන ලබාදීමට සිදුවන බව කියා සිටී. එම ප්‍රකාශය පිළගත නොහැකි අතර වෙනත් නිලධාරීන්ට ද යම් අයිතිවාසිකමක් ඇත්නම් ඒවා ලබාදීම වගඋත්තරකරුගේ වගකීම වන අතර මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිලි කර ඇති මෙම පැමිණිලිකරුවන් තිදෙනාට පමණක් සීමා වන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම නිර්දේශය ලබාදෙන බව වගඋත්තරකරු වෙත දැනුම් දී සිටිමි. සිය පැමිණිලි ඉදිරිපත් නොකර නිද්‍රාශීලීව සිටින සෙසු නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නිර්දේශය කිසිසේත්ම අදාළ නොවන බව වගඋත්තරකරු වෙත දැනුම් දෙන අතර හුදෙක්ම මෙම පැමිණිලිකරුවන්ට පමණක් සීමාවන්නක් බව වැඩිදුරටත් කියා සිටිමි.

**නිර්දේශය**

ඒ අනුව නියමිත කාලය තුළ උසස්වීම් ලබා නොදීම තුලින් හා ඒ හා සම්බන්ධ පැමිණිලිකරුවන්ට ලබාගත හැකිව තිබූ රාජ්‍ය සේවයේ විවිධ උසස් තනතුරුවලට පිවිසීමේ අවස්ථාව අහිමි කිරීමෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදිත සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම (නීතිය පසිඳලීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය.) යන මූලික අයිතිවාසිකම් 01 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බවට නිර්දේශ කරන අතර,

01 1994 වර්ෂයට පැමිණිලිකරුවන්ට 1 ශ්‍රේණියට උසස්වීම් ලබා දී එම වර්ෂයට පත්වීම් පෙරදාතම් කරන ලෙසත්,

02 ඒ ඒ කාලසීමාවල ක්‍රියාත්මක වූ වැටුප් ප්‍රතිශෝධන වලින් ලැබිය යුතුව තිබූ වරප්‍රසාද හිග වැටුප් ලබා දෙන ලෙසත්,

03 ඒ අනුව මේ වන විට විශ්‍රාම ගොස් ඇති පැමිණිලිකරුවන්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය කර ගැලපීම් කර හිග වැටුප් ලබාදෙන ලෙසත් වගඋත්තරකරුවන් වෙත නිර්දේශ කරන අතර,

මෙම නිර්දේශය ප්‍රකාරව කටයුතු කර 2022- 02 . 21 දිනට පෙර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන්වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හෝ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka